**පාඨමාලා සංකේතය:** BUPH E2025

**වර්ගීය:** C

**මාතෘකාව :** බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමයාන්තර චින්තා.

**අරමුණු හා අභිප්‍රේතාර්ථ:**

පුද්ගලයා හා සමාජ සංවිධානය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හඳුනා ගනිමින් ඉන්දියානු සමයාන්තර චින්තාවන්හි පැනෙන පාරභෞතික සංකල්ප විචාරාත්මකව අධ්‍යයනය කිරීම මින් අපේක්ෂිතයි.

**ඉගෙනුම් ඵල:**

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින් විද්‍යාර්ථියා පුද්ගලයා හා සමාජ ආර්ථික සංවිධානය පිළිබඳ බෞද්ධ දැක්ම ප්‍රගුණ කර ගනිමින් පාරභෞතික හා සමයාන්තර චින්තාවන්ට ගැති නොවී ක්‍රියා කිරීමට යොමු වෙයි.

**පාඨමාලා අන්තර්ගතය :**

සමාජ දර්ශනයේ විෂයක්ෂේත්‍රය හඳුන්වා දීම, බෞද්ධ සමාජ දර්ශනයේ පදනම, බුද්ධකාලීන භාරතයේ සමාජ තත්ත්වය, මානව සංහතියේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්, බෞද්ධ ආර්ථික සංවිධානය, සමාජ ප්‍රගතිය හා පරාභවය, යුතුකම් හා වගකීම්, රාජ්‍ය පාලනය හා සමාජ නායකත්වය, නීතිය අපරාධය හා දඬුවම, සාමයික සහජීවනය හා සහනශීලීත්වය, වර්තමාන සමාජ ප්‍රශ්න විසඳීමෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල අදාළත්වය, ගිහි පැවිදි සම්බන්ධය. පාරභෞතික විද්‍යාව හඳුනාගැනීම, ඒ පිළිබඳ අර්ථ විග්‍රහය. ඊශ්වරවාදය හා බුදුසමය - ලෝකය පිළිබඳ පාරභෞතික විවරණ හා බුදුසමය, අව්‍යාකෘත ප්‍රශ්න, ආත්මවාදය හා ඒ පිළිබඳ බෞද්ධ විචාරය, කර්මය හා පුනරුත්පත්තිය පිළිබඳ සමයාන්තර ඉගැන්වීම් හා බුදුසමය, මෝක්ෂය පිළිබඳ සමයාන්තර ඉගැන්වීම් හා නිර්වාණය.

**ක්‍රමවේදය :**

අත් පත්‍රිකා, අධ්‍යයන මාර්ගෝපදේශ හා සම්මන්ත්‍රණ.

**ඇගයීම් ක්‍රමය :**

වර්ෂාවසානයේදී පැවැත්වෙන පැය 03ක ලිඛිත පරීක්ෂණය, අධ්‍යයන සම්භාර 05කි. ලකුණු සියයකි.

**නිර්දේශිත කියවීම්:**

සෝමරංසි හිමි, උඩගලදෙණියේ. (1970).*බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය*, ජී. ජී. අබේකෝන් බණ්ඩාර, තලාව.

විජේසේකර, හේමචන්ද්‍ර. (1961). *බෞද්ධ සමාජ ධර්ම.*මහනුවරඃබෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන.

ප්‍රනාන්දු, එස්. දයා. (1984). *බුදුසමයේ දේශපාලන චින්තනය.*කොළඹ.

මලලසේකර, ජී. ජී. හා ජයතිලක, කේ. එන්. (1960). *බුදුසමය හා ජාති ප්‍රශ්නය.*කොළඹඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

*බෞද්ධ සමාජ දර්ශනය.* (1997). බුද්ධ ශාසන අමාත්‍යාංශය.

ධර්මසිරි, ගුණපාල. (1970). *දාර්ශනික ප්‍රශ්න.* කොළඹඃ  අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වීරරත්න, ඩබ්ලිව්, ජී. *බෞද්ධ දේව සංකල්පය.* මහනුවරඃ බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන.

ග්ලෙසෙනප්, හෙල්මන් වොන්. (1963). *බුදුසමය හා කිතුසමය.* මහනුවරඃ බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන.

Dharmasiri, G. (1974). *Buddhist Critique of  The Christian Concepte of God.* Colombo.

Joshi' L.N. (1970). *Brahamanism.* (1970).  *Buddhism and Hinduism*. Kandy.

Jayatileka. K.N. (1972). *Ethics in Buddhist Perspective.*Kandy.

Gnanarama Thero, P. (1966). *An Introduction to Buddhist Social Philosophy*. Singapore.